ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## <u>පුවත්පත් නිවේදනය</u>

# මහ කොමසාරිස්තුමා අස්ගිරි සහ මල්වතු මහා නාහිමිවරු බැහැදකී

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා මල්වතු පාර්ශවයේ මහා නායක අති පූජ්‍ය තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල නාහිමිපාණන් සහ අස්ගිරි පාර්ශවයේ මහා නායක අති පූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඥානරතන නාහිමිපාණන් 2023 අප්‍රේල් 22 වන දින මහනුවර දී බැහැදැක ආශිර්වාද ලබා ගත්තේය.

2. මහා නාහිමිවරු දෙපළ මෙහිදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින සියවස් ගණනක් පැරණි සම්බන්ධතාවය අවධාරණය කළ අතර විශේෂයෙන්ම ශ්‍රී ලංකාව විසින් මුහුණ දුන් විවිධ අර්බුදයන් හිදි ශ්‍රී ලංකාවට සහයෝගය ලබා දීම සඳහා ඉන්දීය රජය විසින් ගත් පියවර අගය කළහ.

3. මහ කොමසාරිස්තුමා ශක්තිමත් ඉන්දු - ශ්‍රී ලංකා බැඳීමක් සඳහා ආශිර්වාද කළ මල්වතු පාර්ශවයේ මහා නාහිමිපාණන්ට සිය නමස්කාර පූර්වක ස්තුතිය පළ කළේය. ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය විසින් ඉහළ ප්‍රචාරයක් ලබා දී තිබූ 2023 අප්‍රේල් 20 වන දින නව දිල්ලියේ පැවති ගෝලීය බෞද්ධ සමුළුවේ සමාරම්භක දිනය අමතමින් ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් කරන ලද දේශනය පිළිබඳ අදහස් දක්වමින් මහා නාහිමිපාණන් පැවසූයේ මෝදි අග්‍රාමාත්‍යතුමා බුදු දහමට දක්වන සමීපත්වය එතුමාගේ වචන වලින් පමණක් නොව ක්‍රියාවෙන් ද

පැහැදිලි වන බවයි. මහ කොමසාරිස්තුමා මෙහිදී අග්‍රාමාත්‍යතුමාගේ දේශනයේ සිංහල පරිවර්තනය මහා නාහිමිවරුන්ට පිරිනැමීය.

4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවාව පිළිබඳව විමසමින් මල්වතු පාර්ශවයේ මහා නාහිමිපාණන් ප්‍රකාශ කළේ මෙම පියවර විශේෂයෙන්ම දෙරට සාමාන්‍ය ජනතාවට සෙත සලසනු ඇති බවයි.

5. හමුව සඳහා අවස්ථාව ලබා දීම සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශක්තිමත් සබඳතාවයක් සඳහා ආශිර්වාද කිරීම සම්බන්ධයෙන් මහා කොමසාරිස්තුමා අස්ගිරි පාර්ශවයේ මහා නාහිමිපාණන්ට සිය ස්තුතිය පළ කළේය. එසේම එතුමා ශ්‍රී ලංකාවේ ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් මහනුවර සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සිදු කරන වැඩසටහන්වලට ලබා දෙන මඟ පෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් ද මහා නාහිමිපාණන් වහන්සේට සිය කෘතවේදීත්වය පළ කළේය. මහා නාහිමියෝ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් 2017 වසරේදී සිදු කළ මහනුවර සංචාරය පිළිබඳව ද සිහිපත් කළ අතර ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වර්ධනය වන සහයෝගය සහ සමීප සබඳතා අගය කළහ.

***

කොළඹ
2023 අප්‍රේල් 26